# එන්නත්කරණ අවශ්‍යතා

ඔබ ඔබේ සංචාරය වෙන් කරවා ගැනීමට පෙර, ඔබ ජාත්‍යන්තර සංචාර සඳහා වන ඕස්ට්‍රේලියාවේ එන්නත් අවශ්‍යතා සපුරාලන්නේ දැයි පරීක්ෂා කරන්න.

මෙය ඔබට ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට, සහ ඔබ පැමිණීමේදී නිරෝධායනය කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ඇති සුදුසුකම් කෙරෙහි බලපායි.

ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙක් හෝ ස්ථිර පදිංචිකරුවෙකු නම්, මෙය ඕස්ට්‍රේලියාව හැර යාමට ඔබට ඇති සුදුසුකම්වලට ද බලපායි.

# ඕස්ට්‍රේලියාවේ එන්නත් අවශ්‍යතා සපුරාලීම

ඕස්ට්‍රේලියාවේ එන්නත් අවශ්‍යතා සපුරාලීමට සහ ඕස්ට්‍රේලියාවේ දේශසීමා විධිවිධාන සඳහා 'සම්පූර්ණයෙන්ම එන්නත් කරන ලද' සංචාරකයෙකු ලෙස සැලකීමට, ඔබ පහත සාධකවලින් එකක් සැපයිය යුතුය:

- සංචාරය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම එන්නත්කරණයට ලක් වූ බවට ඕස්ට්‍රේලියාවේ නිර්වචනය
- ඔබ වයස 12 ට අඩු ළමයෙකු නම්
- ඔබ වයස 12 සිට 17 දක්වා වන එක් වැඩිහිටියෙකු සමග හෝ සංචාරය කරන හෝ සම්පූර්ණයෙන්ම එන්නත්කරණයට ලක් වූ ළමයෙකු නම්; හෝ
- සෞඛ්‍ය හේතු නිසාවෙන් එන්නත්කරණයට ලක් විය නොහැකි නම්.

ඔබ ඉහත කාණ්ඩවලින් එකක් හෝ සපුරන්නේ නම්, ඔබ එන්නත් කළ සංචාරකයින් සඳහා ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට ඇති පියවර අනුගමනය කළ යුතුය.

ඔබ ඉහත කාණ්ඩවලින් එකක් හෝ සපුරන්නේ නම්, ඔබ එන්නත්කරණය නොකළ සංචාරකයින් සඳහා ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට ඇති පියවර අනුගමනය කළ යුතුය.

**පහත කරුණුවලට අදාළ නම් ඕස්ට්‍රේලියාවට පැමිණෙන වීසා හිමිකරුවන්ගේ වීසා අවලංගු වීම හෝ රඳවා ගැනීම සිදු විය හැක:**

- **ඕස්ට්‍රේලියාවේ දේශසීමා ප්‍රවේශ අවශ්‍යතාවලට අනුකූලව ජාත්‍යන්තර සංචාරක අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් නොකර ඇතිනම්; හෝ**
- **ඕස්ට්‍රේලියානු රජය විසින් නිර්වචනය කරන ලද පරිදි COVID-19 එන්නත සඳහා වෛද්‍ය ප්‍රතිවිරෝධතා නොමැති නම්; හෝ**
- **නිදහස් කළ අංගයක හෝ තනි සංචාරක නිදහස් කිරීමක් නොමැති නම්.**

# ජාත්‍යන්තර සංචාරක අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් කිරීම

චිකිත්සක භාණ්ඩ පරිපාලනය (TGA) විසින් අනුමත කරන ලද හෝ පිළිගත් එන්නතක ප්‍රාථමික පාඨමාලාවක් සම්පූර්ණ කර ඇතිනම්, ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමේ සහ පිටවීමේ අරමුණ සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් කර ඇති බව සලකනු ලැබේ. මෙයට මිශ්‍ර මාත්‍රා ද අදාළ වේ.

ජාත්‍යන්තර සංචාරයින් සඳහා දැනට අනුමත හෝ පිළිගත් එන්නත් මාත්‍රා වන්නේ:

- මේවයින් එකිනෙකින් දින 14 ක පරතරයකින් ලබාගත් පහත ඕනෑම මාත්‍රා දෙකක්:
    - AstraZeneca Vaxzevria
    - AstraZeneca Covishield
    - Pfizer/Biontech Comirnaty
    - Moderna Spikevax or Takeda
    - Sinovac Coronavac
    - Bharat Biotech Covaxin
    - ඕස්ට්‍රේලියාවට ඇතුළු වන විට වයස අවුරුදු 60 ට අඩු පුද්ගලයින් සඳහා Sinopharm BBIBP-CorV
    - Gamaleya Research Institute Sputnik V
    - Novavax/Biocelect Nuvaxovid

    නැතහොත්

- එක් මාත්‍රාවක්:
    - Johnson & Johnson/ Janssen-Cilag COVID Vaccine

**සහ** එන්නත් මාලාවේ අවසාන එන්නත ලබා අවම වශයෙන් දින 7 ක් පසුවී ඇති විට.

සියලුම එන්නත් TGA විසින් අනුමත කර හෝ පිළිගෙන ඇති තාක් කල්, මිශ්‍ර මාත්‍රා ජාත්‍යන්තර සංචාර සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් කිරීමට ගණන් ගනී. [TGA](#) විසින් අනාගතයේදී ඕස්ට්‍රේලියාවට පැමිණෙන සංචාර සඳහා හඳුනාගත හැකි අනෙකුත් COVID-19 එන්නත් ඇගයීමට ලක් කරයි.

ඕස්ට්‍රේලියානු වීසා බලපත්‍රලාභීන්, වලංගු වීසා බලපත්‍රයක් නොමැති පුරවැසියන් නොවන අය සහ ආගමන රැඳවුම් පහසුකම්වල ජීවත් වන පුද්ගලයින් ඇතුළුව ඕස්ට්‍රේලියාවේ සිටින සෑම කෙනෙකුටම COVID-19 එන්නතක් නොමිලේ ලබා ගත හැකිය.

## ඔබ එන්නත් කර ඇති බවට සාධක සැපයීම

ජාත්‍යන්තර සංචාරක අරමුණු සඳහා ඔබ ඕස්ට්‍රේලියාවේ එන්නත් අවශ්‍යතා සපුරාලන බවට ගුවන් සේවා කාර්ය මණ්ඩල සාධක පෙන්වීමට ඔබට අවශ්‍ය වෙයි.

ඔබ [ඩිජිටල් ගමන් ප්‍රකාශය](#) සම්පූර්ණ කරන විට එය උඩුගත කිරීමෙන් ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට පෙර මෙම සාධක සපයන ලෙස ඔබෙන් ඉල්ලනු ලැබේ.

ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු හෝ ස්ථිර පදිංචිකරුවෙකු නම්, ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටවීමට පෙර ගුවන් සේවා කාර්ය මණ්ඩලයට ඔබේ සාධක පෙන්වීමට ද අවශ්‍ය වෙයි.

ඔබ ඕස්ට්‍රේලියාවේදී එන්නත් කර ඇති නම්, ඔබට ඔබේ [ජාත්‍යන්තර COVID-19 එන්නත්කරන සහතිකය (ICVC)](#) ගුවන් සේවා කාර්ය මණ්ඩලය පෙන්වීමට අවශ්‍ය වෙයි.. ඔබේ ජාත්‍යන්තර COVID-19 එන්නත්කරන සහතිකය (ICVC) [Express Plus Medicare යෙදුම](#) හරහා හෝ [myGov](#) හි ඔබේ Medicare මාර්ගගත ගිණුම හරහා බාගත හැක. ICVC ගොනුව ඔබට මුද්‍රණ කිරීමට හෝ ඔබේ දුරකථනෙය් ඉලෙක්ට්‍රොනිකව තබා ගැනීමට PDF ලෙස දෙනු ලැබේ. ඔබ ගුවන් ගමන් සඳහා ඇතුළත් වන විට ගුවන් සමාගම් විසින් මෙය ඉල්ලා සිටිනු ලැබේ.

ඔබ විදේශයකදී එන්නත්කරණයට ලක් වී ICVC නොමැති නම්, ඔබට ඔබේ [විදෙස් එන්නත්කරණ සහතිකය](#) ගුවන් සේවකයින්ට ලබා දීමට සිදු වේ.

ඔබ විදේශයකදී එන්නත් කර ඇතිනම් සහ ICVC ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔබට ඔබේ [විදේශීය ප්‍රතිශක්තිකරණ ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛනයට (AIR)](#) එක් කළ හැක. ඔබ මෙය සම්පූර්ණ කළ පසු, ඔබට ICVC සඳහා ඉල්ලුම් කළ හැක.

ඔබට එන්නත් සහතිකයක් තිබේ නම්, ඔබ ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර සංචාරක අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් කළ සංචාරකයෙකු බව මෙයින් ස්වයංක්‍රීයව අදහස් **නොවන** බව **සලකන්න**. උදාහරණයක් ලෙස, ඔබේ එන්නත් සහතිකය ඔබට ඇත්තේ මාත්‍රා දෙකක එන්නතක එක් මාත්‍රාවක් පමණක් බව පෙන්විය හැක. [ජාත්‍යන්තර සංචාර සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් කිරීම](#) පිළිබඳ ඕස්ට්‍රේලියාවේ නිර්වචනය ඔබ සපුරාලන බව ඔබේ එන්නත් සහතිකය ඔප්පු කළ යුතුය

ඔබේ එන්නත් තත්ත්වය දැන ගැනීම සහ ඔබේ එන්නත් සහතිකය ඕස්ට්‍රේලියාවට යාමට සහ පැමිණීමට ඔබට ඇති සුදුසුකම් සඳහා සහය දක්වන්නේ දැයි පරීක්ෂා කිරීම ඔබේ වගකීම වෙයි.

## ඔබගේ එන්නත් සහතිකයේ නම ඔබගේ විදේශ ගමන් බලපත්‍රය සමග නොගැළපේ නම්

ඔබ ඕස්ට්‍රේලියානු විදේශ ගමන් බලපත්‍ර හිමියෙක් නම් සහ ඔබ ඔබේ නම වෙනස් කර ඇති නම්, ඕස්ට්‍රේලියානු විදේශ ගමන් බලපත්‍ර කාර්යාලය සම්බන්ධ කර ගැනීමෙන් ඔබට නව විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු සොයාගත හැකිය.

ඔබ ඕස්ට්‍රේලියාවේදී එන්නත් කර ඇති නමුත් ඔබේ එන්නත් සහතිකයේ නම විස්තර ඔබගේ විදේශ ගමන් බලපත්‍රය නොගැළපෙන නිසා ICVC ලබා ගත නොහැකි නම්, ඔබට ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛනය සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය වෙයි.

ඔබගේ විදේශ ගමන් බලපත්‍රයේ නමට නොගැළපෙන විදේශීය එන්නත් සහතිකයක් සමග ඔබ ගමන් කරන්නේ නම්, විවාහ සහතිකයක් හෝ රියදුරු බලපත්‍රයක් වැනි ඔබේ නම පිළිබඳ වෙනත් සාධක ඔබ සතුව ඇති බවට සහතික විය යුතුය.

# ළමුන් සඳහා වන විධිවිධාන

පහත කණ්ඩායම්වල ළමුන්ට එන්නත් කළ සංචාරකයින් මෙන් එකම විධිවිධාන යටතේ ගමන් කළ හැකිය:

- වයස අවුරුදු 12 ට අඩු; හෝ
- වයස අවුරුදු 12 සිට 17 දක්වා සහ සම්පූර්ණයෙන් එන්නත් කරන ලද අවම වශයෙන් එක් වැඩිහිටියෙකු සමග සංචාරය කිරීම

විදේශ ගමන් බලපත්‍ර දරුවන්ගේ වයස සනාථ කිරීම සඳහා ද භාවිත කෙරේ.

ඔබ එන්නත් නොකළ හෝ අර්ධ වශයෙන් එන්නත් කළ දරුවන් සමග ගමන් කරන පවුල් කණ්ඩායමක් නම්, ඔබ සංක්‍රමණය වීමට සහ සංචාරය කිරීමට අදහස් කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමි සඳහා නිරෝධායන හෝ ස්වයං හුදෙකලා අවශ්‍යතා ද පරීක්ෂා කළ යුතුය. වැඩිදුර තොරතුරු සඳහා ප්‍රාන්ත හා දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා බලන්න.

# ඔබට සෞඛ්‍ය හේතු නිසාවෙන් එන්නත්කරණයට ලක් විය නොහැකි නම්

වෛද්‍ය හේතූන් මත ඔබට එන්නත් කළ නොහැකි නම්, ඔබ වෛද්‍ය ප්‍රතිවිරෝධතාවක් පිළිබඳ පිළිගත හැකි සාධක සැපයිය යුතුය.

ඔබ පිළිගත හැකි සාධක සපයන්නේ නම්, එන්නත් කරන ලද සංචාරකයින් මෙන් එකම ගමන් විධිවිධාන යටතේ ඔබට ගමන් කළ හැකිය. ඔබ ගමන් කිරීමට පෙර ගුවන් කාර්ය මණ්ඩලයට ඔබේ සාධක පෙන්වීමට ඔබට අවශ්‍ය වෙයි.

ඔබ සංක්‍රමණය වන සහ ගමන් කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමි සඳහා වන අවශ්‍යතා, විශේෂයෙන් නිරෝධායන අවශ්‍යතා ද පරීක්ෂා කළ යුතුය. බලන්න: ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා.

**වෛද්‍ය ප්‍රතිවිරෝධතාවක් නිසා ඔබට එන්නත් කළ නොහැකි බවට සාධක සංචාරක නිදහස් කිරීමකට වඩා වෙනස් වේ.**

## ඕස්ට්‍රේලියාවෙන් පිටවන විට වෛද්‍ය හේතු මත ඔබට එන්නත් කළ නොහැකි බවට සාධක

ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු නම් හෝ ඕස්ට්‍රේලියාවෙන් පිටව යන ස්ථිර පදිංචිකරුවෙකු නම්, ඕස්ට්‍රේලියාවේ පවතින සියලුම COVID-19 එන්නත් සඳහා ඔබට ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛනයට (AIR) වාර්තා වී ඇති වෛද්‍ය ප්‍රතිවිරෝධතා ඇති බවට සාධක පෙන්විය යුතුය. ඔබ ඔබේ ඕස්ට්‍රේලියානු COVID-19 ඩිජිටල් සහතිකය හෝ ඔබේ ප්‍රතිශක්තිකරණ ඉතිහාස ප්‍රකාශය සාධක වශයෙන් ලබා දිය යුතුය.

AIR හි තාවකාලික වෛද්‍ය ප්‍රතිවිරෝධතාවක් සටහන් වී ඇතිනම්, COVID-19 ඩිජිටල් සහතිකය 'වලංගු' දිනයක් පෙන්වෙයි. මෙම කාලයෙන් පසු, ඔබට පහත දෙකෙන් එකක් කිරීමට සිදුවේ:

- ඔබට දැන් COVID-19 එන්නතක් ලබා ගත හැකි දැයි බැලීමට ඔබේ වෛද්‍යවරයාගෙන් විමසන්න; හෝ
- ඔබේ වෛද්‍ය ප්‍රතිවිරෝධතා තවමත් වලංගු නම් AIR හි ඔබේ තත්ත්වය යාවත්කාලීන කරන ලෙස ඔබේ වෛද්‍යවරයාගෙන් ඉල්ලා සිටින්න.

Services Australia විසින් නිර්වචනය කර ඇති පරිදි සුදුසුකම් ලත් සෞඛ්‍ය වෘත්තිකයන්ට පමණක් AIR වෙත වෛද්‍ය ප්‍රතිවිරෝධතා වාර්තා කළ හැකිය. ඔබේ වෛද්‍ය ප්‍රතිවිරෝධතාව AIR වෙත වාර්තා කර ඇති බව ඔබට නිරූපණය කළ නොහැකි නම්, ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටවීමට නිදහස් කිරීමකට අයදුම් කිරීමට අවශ්‍ය වෙයි.

ඔබේ වෛද්‍ය ප්‍රතිවිරෝධතා AIR හි ලැයිස්තුගත කර ඇති බවට **ඔබට පිළිගත හැකි සාධක සැපයිය නොහැකි නම්**, ඔබ **[ඕස්ට්‍රේලියාවෙන් පිටවීමට සංචාරක නිදහස් කිරීමකට ඉල්ලුම් කළ යුතුය]**.

## ඕස්ට්‍රේලියාවට ඇතුළු වන විට වෛද්‍ය හේතූන් මත ඔබට එන්නත් කළ නොහැකි බවට සාධක

සම්පූර්ණයෙන්ම එන්නත් කරන ලද සංචාරකයින් ලෙස එකම ගමන් විධිවිධාන වෙත ප්‍රවේශ වීමට, ඔබ වෛද්‍ය හේතූන් මත ඔබට එන්නත් කළ නොහැකි බවට පිළිගත හැකි සාධක සැපයිය යුතුය.

ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වන්නේ නම් සහ ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛනයේ (AIR) වෛද්‍ය ප්‍රතිවිරෝධතා වාර්තා කර ඇතිනම් ඔබට [ඕස්ට්‍රේලියානු COVID-19 ඩිජිටල් සහතිකයක්] ගුවන් සේවා කාර්ය මණ්ඩලයට පෙන්විය හැකිය. ඔබට වෙනත් ආකාරයකින් ඔබේ ප්‍රතිශක්තිකරණ ඉතිහාස ප්‍රකාශය පෙන්විය හැක.

ඔබ AIR හි ඔබගේ වෛද්‍ය ප්‍රතිවිරෝධතා වාර්තා කර නොමැති නම්, ඔබට රෝගී තත්ත්වයක් හේතුවෙන් COVID-19 එන්නත ලබා දිය නොහැකි බව පෙන්නුම් කරන වෛද්‍ය සහතිකයක් ගුවන් කාර්ය මණ්ඩලයට පෙන්වීමට අවශ්‍ය වෙයි. වෛද්‍ය සහතිකය ඉංග්‍රීසියෙන් තිබිය යුතු අතර පහත තොරතුරු ඇතුළත් විය යුතුය.

- ඔබගේ නම (මෙය ඔබගේ සංචාරක හැඳුනුම්පත් ලේඛනවලට ගැළපිය යුතුය)
- වෛද්‍ය උපදේශන දිනය සහ ඔබේ වෛද්‍යවරයාගේ විස්තර
- ඔබට COVID-19 එන්නත ලබා ගත නොහැකි බව එයින් අදහස් වන වෛද්‍ය තත්ත්වයක් ඇති බව පැහැදිලිව දක්වා ඇති විස්තර (එන්නත් කිරීම අවධානම් බව).

*මෙම ප්‍රවර්ගයට TGA අනුමත නොවන හෝ පිළිගත් එන්නත් ලබා ගත් පුද්ගලයන් ඇතුළත් නොවන බව සලකන්න.*

***[සෞඛ්‍ය දෙපාර්තමේන්තුව] උපදෙස් දෙන්නේ කලින් COVID-19 ආසාදනය වීම COVID-19 එන්නත සඳහා වෛද්‍ය ප්‍රතිවිරෝධයක් ලෙස නොසලකන බවයි.***

ඔබේ වෛද්‍යවරයාට සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් එන්නත් කිරීම අවදානම් යන්නෙන් අදහස් වන වෛද්‍ය තත්ත්ව පිළිබඳ තොරතුරු සොයා ගත හැක. COVID-19 එන්නත සඳහා ප්‍රතිවිරෝධතාවක් ලෙස **නොසැලකෙන** සහ ඕස්ට්‍රේලියාවට සංචාරය කිරීම සඳහා එන්නත් කිරීම සඳහා වෛද්‍යමය නිදහස් කිරීමේ අරමුණින් පිළි **නොගන්නා** කොන්දේසි පිළිබඳ තොරතුරු ද වෙබ් අඩවියේ ඇතුළත් වේ. **බලන්න**: [COVID-19 එන්නත සඳහා වෛද්‍ය ප්‍රතිවිරෝධතා පිළිබඳ සාධක].

ඔබගේ සාධක මෙම අවශ්‍යතා සපුරාලන බව සහතික කිරීම සඳහා ඔබ වගකිව යුතුය. ඇතුළු වීමේදී ගුවන් සමාගම් ඔබගේ සහතිකය ඉල්ලා සිටිනු ලැබේ.

ඔබ සංක්‍රමණය වන සහ ගමන් කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමි සඳහා ඕනෑම අවශ්‍යතාවයක්, විශේෂයෙන් නිරෝධායන සහ පසු පැමිණීමේ පරීක්ෂණ අවශ්‍යතා පරීක්ෂා කළ යුතුය.

ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණෙන විට වෙනත් ප්‍රාන්තයකට හෝ දේශභූමියකට හෝ ඒ හරහා ගමන් කිරීමට සැලසුම් කරන්නේ නම්, ඔබ දේශීය සංචාරක සීමා පරීක්ෂා කළ යුතුය. ප්‍රාන්ත සහ දේශභූමිවලට ඔවුන්ගේම සංචාරක සීමා යෙදිය හැක.

ඔබට අදාළ වන සංචාරක සීමා හා අවශ්‍යතාවලට අනුගත වීම ඔබේ වගකීම වෙයි.

**ඔබට පිළිගත හැකි වෛද්‍ය සාධක සැපයිය නොහැකි නම්, ඔබට ඕස්ට්‍රේලියාවට යාමට සංචාරක නිදහස් කිරීමක් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය විය හැකිය..**

# COVID-19 පරීක්ෂණය

ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට හෝ සංක්‍රමණය වීමට සෘණ COVID-19 පරීක්ෂණ ප්‍රතිඵලයක් අවශ්‍ය වේ.

ඔබ මෙම දෙකෙන් එකක් සාධක ලෙස සපුරාලිය යුතුය

- ඔබගේ ගුවන් යානයේ නියමිත පිටත් වීමට දින 3කට පෙර ගන්නා ලද සෘණ COVID-19 Polymerase Chain Reaction (PCR) හෝ වෙනත් Nucleic Acid Amplification Test (NAAT) පරීක්ෂණයක්,
- ඔබගේ පියාසැරිය පිටත් වීමට පෙර පැය 24ක් ඇතුළත වෛද්‍ය අධීක්ෂණය යටතේ ගන්නා ලද සෘණාත්මක වේගවත් ප්‍රතිදේහජනක පරීක්ෂණයක (RAT) සාධකයක් ලෙස වෛද්‍ය සහතිකයක්, ඔබ ඇතුළු වන විට ඔබේ ගුවන් සමාගමට සැපයිය යුතුය.

ඔබගේ ගුවන් ගමන ප්‍රමාද වන්නේ නම්, ඔබ තවමත් පිටත් වීමට පෙර පරීක්ෂණ අවශ්‍යතා සපුරා ඇති බව සලකනු ලැබේ. ඔබ නව පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය නොවේ.

කෙසේ වෙතත්, ඔබගේ පියාසැරිය නැවත කාලසටහන්ගත කර ඇතිනම් හෝ අවලංගු කර ඇතිනම්, නැවත සැලසුම් කළ පියාසැරියට දින 3කට පෙර නොගත් කොවිඩ්-19 PCR පරීක්ෂණයක් හෝ නැවත කාලසටහන්ගත කළ පියාසැරියට පැය 24ක් ඇතුළත ලබාගත් RAT පරීක්ෂණයක් පිළිබඳ සාධක සැපයීමට ඔබට අවශ්‍ය වෙයි.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ඔබට සැපයිය යුතු සාධක පිළිබඳ තොරතුරු සොයාගත හැකිය. මෙයට ඇතුළත් වන්නේ:

- COVID-19 පරීක්ෂණ අවශ්‍යතා, මෙයට ඇතුළත් වන්නේ:
  - පිළිගත හැකි පරීක්ෂණ
  - අවශ්‍ය නිශ්චිත සාධක
  - පරීක්ෂණ සඳහා දීර්ඝ කාල රාමු සහිත රටවල් ලැයිස්තුවක්
  - පෙර පිටත් වීමේ පරීක්ෂණයෙන් නිදහස් කර ඇති රටවල් ලැයිස්තුවක්
- ඔබ COVID-19 ලබාගෙන සුවය ලැබූ විට ඔබේ පරීක්ෂණ ප්‍රතිඵලය ධනාත්මක නම් කුමක් කළ යුතුද?

ඔබ සංක්‍රමණය වන සහ සංචාරය කරන සියලුම රටවල් සඳහා පරීක්ෂණ සහ එන්නත් අවශ්‍යතා පිළිබඳ සාධක පරීක්ෂා කිරීම සඳහා ඔබ වගකිව යුතුය.

බොහෝ ප්‍රාන්ත සහ දේශභූමිවල ඔබ පැමිණීමෙන් පසු ඉක්මනින් COVID-19 පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය වේ. වැඩිදුර තොරතුරු සඳහා ප්‍රාන්ත හා දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා බලන්න.